රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 2/97(V)

මගේ අංකය :- ආ1/4/10
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1999 නොවැම්බර් 25 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1997 වැටුප් විෂමතා කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම -**
**සාමාන්‍ය ලිපිකරු හා සමාන්තර සේවා වැටුප්.**

1997.11.12 දිනැති අංක: 2/97(III) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව ලිපිකරු හා සමාන්තර සේවාවන්හි වැටුප් සැකසීමේදී 1994.08.01 දින සිට 1996.12.31 දින දක්වා උසස්වීම් මගින් එම සේවාවන්හි I වැනි පන්තියට හා අධි ශ්‍රේණියට උසස්වූවන් සඳහා ලැබෙන වැටුප අනුව, 1994.08.01 දිනට පෙර උසස්වීම් ලැබුවන්ගේ වැටුපෙහි විෂමතාවයක් හටගෙන ඇත.

02. එබැවින් 1997.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අංක 2/97(III) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:5 ජේදය 1994.08.01 දිනට ලිපිකාර සහ සමාන්තර සේවාවල 1 වන පන්තියේ සහ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි ශ්‍රේණියේ සිටි නිලධාරීන් සම්බන්ධයෙන් ඉවත් කිරීමට රජය තීරණය කර ඇත.

03. මේ අනුව 1994.08.01 දිනට ලිපිකාර හා සමාන්තර සේවාවල I පන්තියේ හා සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි ශ්‍රේණියේ සිටි නිලධාරීන්ගේ වැටුප් ඇමුණුම් I හා ඇමුණුම් II අනුව පරිවර්තනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

04. 1999 වර්ෂයේ මුදල් ප්‍රතිපාදන තුළ ප්‍රමාණවත් ඉතිරි කිරීම් තිබේ නම් 1999 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වෙනුවෙන් මේ අනුව වැටුප් ගෙවිය හැකිය. 1997.01.01 සිට 1999.10.31 දක්වා හිඟ වැටුප් ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන 2000 වර්ෂයේ ඇස්තමේන්තු වලට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය.

05. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 1994.08.01 දින වන විට ලිපිකාර හා සමාන්තර සේවාවල I වැනි පන්තියේ සහ සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි ශ්‍රේණියේ සිටි නිලධාරීන්ට අදාළ වේ. ලිපිකාර සහ සමාන්තර සේවා වශයෙන් සලකනු ලබන්නේ අංක.29/94 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් සාමාන්‍ය ලිපිකාර සේවය, යතුරු ලේඛක සේවය, ලඝුලේඛක සේවය, පොත් තබන්නා සේවය, සරප් සේවය හා ගබඩා භාරකරුවන්ගේ සේවය යන සේවාවන්ය.

06. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

(මහින්ද බන්දුසේන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

**1994.08.01 දිනට සාමාන්‍ය ලිපිකාර සේවයේ හා සමාන්තර සේවාවල**
**<u>I වන පන්තියේ නිලධාරීන්ගේ වැටුප් පරිවර්තන චක්‍රය</u>**

| රා.පරි.ච.37/92 | 1996.12.31 වැටුප<br>රා.පරි.ච. | 1997 සංශෝධිත වැටුප |
|---|---|---|
| | | 69480 |
| | | 71040 |
| | | 72600 |
| | | 74160 |
| 34920 | 46320 | 75720 |
| 35700 | 47520 | 77280 |
| 36480 | 48720 | 78840 |
| 37260 | 49920 | 80400 |
| 38040 | 51120 | 81960 |
| 38820 | 52320 | 83520 |
| 39600 | 53520 | 85080 |
| 40380 | 54720 | 86640 |
| 41160 | 55920 | 88200 |
| 41940 | 57480 | 90000 |
| 42720 | 59040 | 91800 |
| 43500 | 60600 | 93600 |
| 44280 | 62160 | |
| 45060 | 63720 | |
| | 65280 | |
| | 66840 | |

ඇමුණුම් II

**1994.08.01. දිනට සාමාන්‍ය ලිපිකාර සේවයේ**

**<u>අධි ශ්‍රේණියේ නිලධාරීන්ගේ වැටුප් පරිවර්තන චක්‍රය</u>**

| රා.පරි.ච.37/92 | 1996.12.31 රා.පරි.ච. | 1997 සංශෝධිත වැටුප |
|---|---|---|
| | | 90120 |
| | | 92580 |
| | | 95040 |
| | | 97500 |
| | | 99960 |
| | | 102420 |
| | | 104880 |
| | | 107340 |
| 45120 | 60120 | 109800 |
| 46320 | 61680 | 112260 |
| 47520 | 63240 | 114720 |
| 48720 | 64800 | 117180 |
| 49920 | 66360 | 119640 |
| 51120 | 67920 | 122100 |
| 52320 | 69480 | 124560 |
| 53520 | 71040 | 127020 |
| 54720 | | 129480 |
| 55920 | | |
| 57120 | | |